# ලෝ පුරා කෝටි 400 ක් මීයෝ

## එක ජෝඩුවකින් තුන් වසරකදී 35 කෝටියක්!

### ධාන්‍ය විනාශය වසරකට ටොන් තුන් කෝටිය පනී

ගොවි ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි දීත්, අලෙවියෙහි දීත්, එම කටයුතුවලට නිරන්තරයෙන් ම වාගේ හතුරු වන්නවුන් අතුරෙන් මීයා මුල් තැනක් ගනී. අග්නිදිග ආසියාවේ ඉතාමත් විනාශකාරී වසංගත යක් බවට දැන් ඌ පත්ව ඇත. දැඩි සීතල හිමේ පටන් දැඩි උණුසුම් කාන්තාරය දක්වා ඕනෑම තැනක ජීවත් විය හැකි අරුම පුදුම ඔරොත්තුදීමේ හැකියාවක් තිබීම මීයා ගේ පැවැත්මට ප්‍රධානතම හේතුව ය.

ගබඩා කෙරුණු ආහාර ද්‍රව්‍ය කෑමට මෙන් ම නරක් කර දැමීමට ද මීයා තුළ ඇති ශක්තිය පුදුමාකාරය. එක මීයෙකුට වසරක කාලයක් ආහාර ගබඩාවක නිදැල්ලේ හැසිරෙන්නට ඉඩ හැරියොත් ආහාර රාත්තල් 27 ක් කන අතර, උගේ බෝවීම ද පුදුමාකාරය. වසරකට තුනටත්, හයටත් අතර වාර ගණනක දී පැටව් ලැම සිදු වේ. එකවිතාවක දී ලන පැටවුන් ගණන පහටත්, දහයටත් අතර විය හැකි ය. පැටවුන් 17 ක් ලද අවස්ථාද තිබේ. මේ අනුව, බාහිර කිසිම උපද්‍රවයක් නොතිබුණොත් මී ජෝඩුවක් නිසා වසර තුනක දී බිහි වෙන පරම්පරාව මීයන් දෙකෝටියටත්, 35 කෝටියටත් අතර සංඛ්‍යාවකි. ස්වභාව ධර්මයේ බලපෑම නිසාත්, මිනිසා ගෙන යන සටන නිසාත්, මීයා ගේ ජීවිතයෙහි රඳ පැවත්ම සීමා වී ඇත. විද්‍යානුකූල සාධක අනුව උගේ ජීවිත කාලය වසර තුනේ සිට පහ දක්වා අතර වුව ද, දැන් එය මාස හයේ සිට නමය දක්වා අතර කාලයකට සීමා වී තිබේ.

**පිලිපීනයේ වී අස්වැන්නෙන් සියයට 10 ක් ද, ඉන්දුනීසියාවේ වී අස්වැන්නෙන් සියයට 15 කටත්, 20 ටත් අතර ප්‍රමාණයක් ද, මීයන්ට වසරක් පාසා ගොදුරු වෙයි. මේ අතර, තායිලන්තයේ පොල් නිෂ්පාදනයෙන් සියයට 20 ක් ද, උක් නිෂ්පාදනයෙන් සියයට 40 ක් සහ සමහර වසර වලදී වී අස්වැන්නෙන් සියයට 70 ක් පමණ ද, මීයන් නිසා අලාභයට යන අයුරු සමීක්ෂණයක දී ඔප්පු වී ඇත.**

තවත් විශාල ප්‍රමාණයක් නරක් වෙන අයුරින් බෙටි 25,000 ක් පමණ හෙලන බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ සංඛ්‍යා ලේඛන වලින් හෙළි වේ. ලෝ පුරා ගබඩා වල ඇති ධාන්‍ය අතුරෙන් ටොන් තුන් කෝටි තිස් ලක්‍ෂයකට වැඩි ප්‍රමාණයක් අවුරුදු පතා මීයන් විසින් විනාශ කර දමනු ලබන බව ද හෙළි වී තිබේ.

මීයාට එරෙහිව ගෙන යන සටනේ දී මිනිසා තවමත් දෙවැනි තැන යයි විශ්වාස කළ හැකි තරම් ය. එක්සත් ජාතීන් ගේ නිලධාරීන් පවසන අන්දමට ලෝ පුරා වෙසෙන මී පරපුරේ සංඛ්‍යාව කෝටි 400 ඉක්මවා ඇත. එනම්, ලෝකයේ මිනිස් ජනගහනයට බොහෝ සෙයින් සමාන සංඛ්‍යාවකි. ශ්‍රී ලංකාව ඇතුළු අග්නිදිග ආසියා කරයේ පමණක් කෝටි 100 කට වැඩි මීයන් සංඛ්‍යාවක් වෙසෙතැයි විශ්වාස කරනු ලැබේ.

බොහෝ අවස්ථාවල දී මීයෝ ගුවන් යානා, නැව් ආදියට පවා රිංගා රටින් රටට ද යති. කොපමණ උපක්‍රම යෙදුවත් තම පරපුර ලෝක යෙන් තුරන් කරන්නට ඌ ඉඩ දෙන්නේ නැත ආත්මාරක්ෂාව සඳහා ඌ තුළ යම් යම් ගති ගුණ ස්වභාවයෙන් ම පිහිටියේ ය. විෂ යෙදූ ආහාර කැබැල්ලක් තැබුව හොත් එය අළුතෙන් දක්නට ලැබුණ දෙයක් නිසා දවස් කිහිපයක් යන තුරු හිතා මතා ම ඌ ඊට කිට්ටු නොවෙයි. එම ආහාර කැබැල්ලට ඇස පුරුදු වූවාට පසුව පමණක් ඊට

කිව්වු වන මීයා මුලින් ම ඉතා පරිස්සමින් ඉතා කුඩා කැබැල්ලක් විකා බලයි. විෂ ගතිය හෝ අමුත්තක් හෝ දැනෙන්නට තිබුණොත් වහාම කෑම නවත්වන උං තම සහෝදරයන්ට ද කෙරෙන අනතුරු ඇඟවීමක් හැටියට ආහාර කැබැල්ලට මුත්‍රා කර පළා යයි

### මී උවදුරින් ගැලවෙන මං

මී උවදුරින් ගැලවීම පිණිස අග්නිදිග ආසියාවෙහි ඇති සාර්ථකම ව්‍යාපාර අතුරෙන් එකක් දියත් කර තිබෙන්නේ පිලිපීනයේ ජාතික අස්වනු ආරක්ෂණ මධ්‍යස්ථානය මගිනි. 1975 සිට 1978 දක්වා වී වගා බිම් අක්කර 52 ලක්ෂයක ගෙනා ගිය අස්වනු රැකීමේ වැඩ පිළිවෙළක් නිසා අස්වනු විනාශය සියයට 4.63 සිට .73 දක්වා අඩු කර ගැනීමට හැකි වී ඇත.

මියන් තුරන් කිරීම සඳහා ඉතාමත් හොඳ ක්‍රමයක් වනුයේ ඔවුන්ට ආහාර සපයා ගත හැකි ක්‍රම ඇවිරීමයි. ආහාර පාන ආදිය සුරක්ෂිත ලෙස ඇසිරීමත්, මියන් ගේ ගොදුරුවලට සුදුසු අන්දමේ ඉවතලන කුණු රොඩු ආදිය මූඩියක් සහිත භාජන වල දැමීමත්, අවට පිරිසිදුව තබා ගැනීමත්, මේ සඳහා අවශ්‍ය කරුණු සමහරකි. මියන්ට ලැහුම් ගැනීමට හෝ සැඟ වී සිටීමට හෝ සුදුසු ස්ථාන සොයා බලා ඇවිරීම ද මී උවදුර මැඩීමට රුකුලෙකි.

● ● ●

## ශ්‍රී ලංකාවේ මෙට්‍රික් යුගය ඇරඹේ

ශ්‍රී ලංකාවේ 'මෙට්‍රික් පරිවර්තන වසර' හැටියට මෙ වසර (1980) හැඳින් විය හැකි ය. දිවයිනේ සියළුම දිස්ත්‍රික්කවල සාමාන්‍ය වෙළෙඳ කටයුතු මෙට්‍රික් ක්‍රමයට පරිවර්තනය කෙරෙන්නේ මේ වසරෙහිදිය

බර, දිග සහ ස්කන්ධය ද මැනීම සඳහා කාලාන්තරයක් තිස්සේ අප භාවිතා කළ රාත්තල් අඩි සහ ගැළුම් ද වෙනුවට කිලෝ ග්‍රෑම්, මීටර සහ ලීටර ද භාවිතා කිරීමේ නියෝගය වෙළෙඳ හා නාවික අමාත්‍යාංශය මගින් දැන් ප්‍රකාශයට පත් කර ඇත. එම නියෝගය අනුව එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයන් මෙට්‍රික් ක්‍රමයට නිල වශයෙන් පරිවර්තනය වෙන දිනයන් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| මාතලේ, නුවරඑළිය, බදුල්ල සහ රත්නපුරය | ... | ... | 1980 මැයි 01 දින |
| මහනුවර, කුරුණෑගල, අනුරාධපුරය සහ කෑගල්ල | ... | ... | 1980 ජුනි 01 දින |
| මාතර, හම්බන්තොට, අම්පාර සහ මොණරාගල | ... | ... | 1980 ජුලි 01 දින |
| මඩකලපුව, ත්‍රිකුණාමලය සහ පොළොන්නරුව | ... | ... | 1980 අගෝස්තු 01 දින |
| කළුතර, ගාල්ල සහ පුත්තලම | ... | ... | 1980 සැප්තැම්බර් 01 දින |
| කොළඹ, ගම්පහ, යාපනය, මන්නාරම, වවුනියාව සහ මුලතිව් | | ... | 1980 ඔක්තෝබර් 01 දින |

ඉහත දැක් වූ දිනවලින් පසුව වෙළෙඳුන් විසින් රාත්තල්, අඩි, ගැළුම් ආදියෙන් භාණ්ඩ විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීමට තැබීම හෝ නො කළයුතු යයි ද නියෝගයෙහි දැක්වේ.

නියෝගයෙහි වැඩිදුරටත් දැක්වෙන ආකාරයට, මෙට්‍රික් ප්‍රමාණවලින් භාණ්ඩ විකිණීමෙහි දී ඒවා ඉදිරිපත් කරනු ලබන්නේ :

(අ) බරින් නම්, කිලෝ ග්‍රෑමයක හා ග්‍රෑම් 100 ක ද, මිල ප්‍රදර්ශනය කළයුතු ය.

(ආ) දිගින් නම්, මීටරයක මිල ප්‍රදර්ශනය කළයුතු ය.

(ඇ) ස්කන්ධයෙන් නම්, ලීටරයක මිල ප්‍රදර්ශනය කළයුතු ය.

# අලෙවි අවශ්‍යතා ඇවිරීමට අතුරු බෝග
# දහයකට පාදක මිල නියම කෙරේ

අතුරු බෝග මිල උච්චාවචනයෙන් නිෂ්පාදකයන් ආරක්ෂා කොට නිෂ්පාදන මිල ගණන් ස්ථාවරව පවත්වා ගෙන යාමේ අරමුණ ඇතිව 1979/80 මාස් කන්නයේ සිට අතුරු බෝග දහයක් සඳහා පාදක මිල ක්‍රමයක් කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කොට ඇත.

මෙම වැඩ පිළිවෙල යටතේ එම බෝග මිල දී ගැනීමේ, ගබඩා කිරීමේ හා වෙළෙඳ පොලට නිකුත් කිරීමේත් වගකීම වී අලෙවි මණ්ඩලය වෙත ද, මණ්ඩලය වෙනුවෙන් ඒවා මිල දී ගැනීමේ කාර්යය කෘෂි සේවා මධ්‍යස්ථාන හා විවිධ සේවා සමූපකාර සමිතිත් වෙත ද පැවරී තිබේ.

මේ අතර, මිල දී ගන්නා ලද බෝග තොග බෙදා හැරීම සඳහා රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේත් අලෙවි හා අපනයන ආයතන සමග එකතු වී මණ්ඩලය මගින් අවශ්‍ය විධි විධාන යොදනු ලබන අතර, දේශීය ඉල්ලුමට අමතරව ඉතිරි වෙන කොටසක් වේ නොත් එය අපනයනය කිරීමට ද පියවර ගනු ලැබේ.

**'පාදක මිල' ක්‍රමයට ගැනෙන අතුරු බෝග හා 1979/80 මාස් කන්නය සඳහා නියමිත පාදක මිළ ගණන් ද පහත දැක්වේ.**

| | | | |
|---|---|---|---|
| වියළි මිරිස් | රාත්තල | රු. | 9.50 |
| වියළි කහ | ,, | රු. | 7.50 |
| රට කජු (පොතු සහිත) | ,, | රු. | 2.25 |
| තල | ,, | රු. | 3,00 |
| සෝයා බෝංචි | ,, | රු. | 2.25 |
| උඳු | ,, | රු. | 1.60 |
| ඉරිඟු | ,, | ශත | .75 |
| ඉඳල් ඉරිඟු | ,, | ශත | .60 |
| කව් පි | ,, | රු. | 2.15 |
| මුං ඇට | ,, | රු. | 3.00 |

මෙම පාදක මිල ගණන් පිළිබඳ තීරණයකට එලැඹී ඇත්තේ නිෂ්පාදන වියදම් ද දේශීය වෙළෙඳ පොලෙහි හා ලෝක වෙළෙඳ පොලෙහිත් මිල ගණන් ද සැලැකිල්ලට ගනිමිනි.

මෙම වැඩ පිළිවෙල සෙසු බෝග සඳහා ද අවශ්‍ය පරිදි ක්‍රමානුකූලව පුළුල් කිරීමට අමාත්‍යාංශය බලාපොරොත්තු වෙයි,

* * * *

# නද බදය මගහැරීමට මහ වෙළෙඳ පොළක්

එළවළු, පළතුරු හා අනෙකුත් ගොවි ද්‍රව්‍ය අලෙවිය සඳහා ඔරුගොඩවත්තේ අළුතෙන් ඉදි කෙරෙන මහ වෙළෙඳ පොළ නවීන පහසුකම් ආදිය සහිත වර්ග අඩි 3,00,000 ක් විශාල සංකීර්ණයෙකි.

මේ අතර, පිටකොටුවේ පරණ නගර ශාලා වෙළෙඳ පොලෙහි සහ එඩින්බර්ග් වෙළෙඳ පොලෙහි ද ප්‍රතිසංස්කරණ කටයුතු දැන් ලහි ලහියේ කෙරී ගෙන යයි.